## ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 24 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 පෙබරවාරි 21 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 අගෝස්තු 21 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සභා කැබ් රථය 2010 මැයි 23 දින අනතුරකට පත් වී එය අළුත්වැඩියාව සඳහා වැය වූ රු:155,700 ක් 2010 වර්ෂයේ සභාවේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණු අතර 2011 මාර්තු 17 දින ලැබුණු රක්ෂණ වන්දි රු:91,750 ක් සභාවේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු:1,015,521 ක් සමුච්චිත අරමුදලට බැර කල යුතු වුවත් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම එම මුදලින් වැඩියෙන් ද වර්ෂය අවසානයේ ණයගැති ශේෂය එම මුදලින් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ඇ) බෙලිහුල්ඔය කුඩා ජල විදුලි බලාගාරය වෙනුවෙන් පුද්ගලික සමාගමකින් සමාලෝචිත වර්ෂයට අයවිය යුතු බදු මුදල් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු:481,369 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ වූ රු:6,054,835 ක් සහා අනුමැතියකින් තොරව ජ'නල් සටහන් අංක 08 මගින් සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු: 7,512,941 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු:4,870,899 ක් වූ අතර ,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු:10,832,791 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂය | ඇස්තමේන් තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. ං000 | රු. ං000 | රු. ං000 |
| (i) | වරිපනම් හා බදු | 90 | 79 | 61 |
| (ii) | බදු කුලී | 36 | 31 | 5 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 350 | 418 | - |
| (iv) | වෙනත් ආදායම් | 2,600 | 2,974 | 703 |

#### 2.2.2 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2011 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.4,002,588 ක් ලැබිය යුතුව තිබූ අතර ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම් ගත කර නොතිබුණි.

#### 2.2.3 හිඟ ජල මනු ගාස්තු

නව ජල සම්බන්ධතාවයක් ලබා දීමේ දී මනු ගාස්තුව ලෙස අය කරන රු: 7,500 ක මුදල ජල සම්බන්ධතාවය ලබා දීමට ප්‍රථම අය කළ යුතු වුවත් 2009 වර්ෂයේ සිට ජල සම්බන්ධතා ලබා දුන් ස්ථාන වලින් රු:613,200 ක හිඟ මනු ගාස්තුවක් අයවීමට තිබුණි.

### 2.3 අවිධිමත් ගනුදෙනු

ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරයකු විසින් සභාවේ සේවකයින් කිහිපදෙනෙකු රැගෙන පෞද්ගලික ඉඩම් කොටසකට බලහත්කාරයෙන් ඇතුළු වී වැටක් ගැසීම හේතුවෙන් පවරා තිබුණු අංක 3267 දරණ නඩුව 2011 අප්‍රේල් 06 දින බලංගොඩ දිසා අධිකරණයේදී සමථයට පත්කර ගෙන තිබුණි.කෙසේ නමුත් මෙම නඩුව වෙනුවෙන් නීතිඥ ගාස්තු ලෙස රු: 20,840 ක් සහා අරමුදලින් ගෙවා තිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) (i) ප්‍රකාරව තනතුරු ඇති කිරීම හා දීමනා ගෙවීමේදී පළාත් පාලන කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් ජලයෝජනා ක්‍රමයක නඩත්තුකරුවන් තිදෙනෙකුට එසේ අනුමැතිය ලබා නොගෙන 2011 මැයි සිට දෙසැම්බර් දක්වා රු: 192,000 ක දීමනා ගෙවා තිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ වූ ගම නැගුම ව්‍යාපෘති නියැදියක 2011 දෙසැම්බර් 12 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දැල මාර්ගය හා මුත්තෙට්ටුවේගම හොළඹිලිතැන්න මාර්ගය

(i) අනුමත පස් සැපයූ බවට තහවුරු කිරීමටගොනු කරන ලද පස් වල මිනුම් ලබා ගෙන තිබුණි.

(ii) 6”* 9” සක්ක ගල් යෙදූ ස්ථාන හදුනාගැනීමට කාර්මික නිලධාර් අපොහොසත් විය.

(iii) ඉහත වැඩ විෂයයන් සදහා රු.494,178 ක් ගෙවා තිබුණි.

(ආ) බෝකොටුව මාර්ගයේ ගල් වීදණ්ඩ අසල පැති බැම්ම ඉදිකිරීම

කර්මාන්තය සදහා 2011 නොවැම්බර් 28 දින රු.588,000 ක මුදලකට ගොවි සංවිධානයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි.

(i) ඇස්තමේන්තුවේ විෂය අංක 3 අනුව 1:3:6 (11/2”) කොන්ක්‍රීට් මිශ්‍රණය සමඟ 4” ගල් යොදා ජලම් කොන්ක්‍රීට් කිරීම සදහා රු.59,400 ක් ඇස්තමේන්තු කර තිබුණද, 6”* 9” සක්ක ගල් වලින් බැම් බැද ඉදිකිරීම් කර තිබූණි.

(ii) වැඩ විෂය සංශෝධනය සදහා ලබාගත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ඇ) මාමල්ගහ වසමේ පන්සල අසල සිට වෙලහින්න දක්වා මාර්ගය

කර්මාන්තය සදහා රු.200,000 ක ප්‍රතිපාදන මත ගොවි සංවිධානයක් සමඟ 2011 නොවැම්බර් 04 දින ගිවිසුමකට එළඹ තිබුණි. ඇස්තමේන්තුවේ දක්වා නොමැති මොරව කදුර පාර කැපීම සදහා පස් කියුබ් 70 ක් සදහා රු.25,900 ක් වැය කර තිබූණ අතර ඇස්තමේන්තුගත මාර්ගයේ කටයුතු ඉටුකර නොතිබුණි.

(ඈ) දම්පිටිය මාර්ගය කොන්ක්‍රිට් කිරීම

රු.600,000 ප්‍රතිපාදන මත ග්‍රාම සංවර්ධන සමිතියක් සමඟ 2010 නොවැම්බර් 12 දින රු.600,000 ක මුදලකට ගිවිසුමකට එළඹ තිබුණි.

(i) ඇස්තමේන්තුවේ විෂය අංක 13 අනුව 1:2:4(3/4") මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් යෙදීම මීටර් 200 ක් සඳහා මිනුම් ගෙන මීටර් 49.2 ක් සඳහා රු.464,660ක් ගෙවා තිබුණි. ඉදිකර තිබූ මාර්ගයේ දිග මීටර් 182.5 ක් වූයෙන් 4.3ක් සඳහා රු40,611ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) වැඩ විෂය අංක 1 මාර්ගය දෙපස කාණු කැපීම සඳහා රු.12,716ක් ගෙවා තිබුනද එම වැඩ විෂය ඉදිකර නොතිබුණි.

2.6 මෙහෙයුම්/කළමණාකරන අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2011 මැයි 26 දින මහා සභා තීරණය අනුව රත්මලවින්න ජල යෝජනා ක්‍රමයට අයත් වත්කම් හා බැරකම් සභාවට පවරා ගතයුතුව තිබුනද 2011 දෙසැම්බැර් 31 දින දක්වාම ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් වැය විෂයන් 18 ක් සඳහාප්‍රතිපාදනය කර තිබූ රු.936,000න් කිසිම වියදමක් දරා නොතිබුණි.

(ඇ) සබරගමුව පළාත් සභා ප්‍රතිපාදන යටතේ අමුපිටිය මාමල්ගහ මාර්ගය කි.මී. 0.00 සිට 2.10 දක්වා වැඩි දියුණු කිරීමේ කර්මාන්තයේ ඇස්තමේන්තු වටිනාකම රු: 2,256,487 ක් වූ අතර ඍජු ශ්‍රම පදනම මත ඉටු කිරීමට 2007 ඔක්තෝබර් 30 දින මහා සභාව තීරණය කර තිබුණි. මෙම කර්මාන්තයේ ඉදිකිරීම් නිශ්චිත දිනට නිම කිරීමට සභාව අපොහොසත්ව තිබුණු අතර කර්මාන්තය සඳහා සභා අරමුදලින් රු: 2,896,873 ක වියදමක් දරා තිබුණ ද පළාත් සභාවෙන් ලැබුණු මුදල රු: 2,201,451 ක විය.

(ඈ) නාකැටිය අතුරු මාර්ගය JCB යන්ත්‍රය යොදා වැඩි දියුණු කිරීමේ කර්මාන්තය සබරගමුව පළාත් සභා ප්‍රතිපාදන යටතේ, ඉදිකිරීම් කටයුතු මද්දේගම ප්‍රජා සංවර්ධන සංවිධානය වෙත පවරා තිබූ අතර මෙහි ඉදිකිරීම් 2010 ජුනි 04 දින නිම කර රු: 57,500 ක් අවස්ථා දෙකකදී ගෙවා තිබුණි. මෙම මුදල ප්‍රතිපූර්ණය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කල වවුචර්පතේ විවිධ අඩුපාඩු හේතුවෙන් ප්‍රතිපූර්ණය කරගැනිමට නොහැකිවීමෙන් ප්‍රාදේශිය සභා අරමුදලට පාඩුවක් වී ඇත.

(ඉ) තත්කාර්ය අතුරු අග්‍රිමයක්, එය දෙන ලද කාර්යය නිම කල විගසම පියවිය යුතු වුවත් 2002 වර්ෂයේ සිට 2011 ඔක්තෝබර් 17 දක්වා වූ කාලය තුල ගෙවූ එකතුව රු:4,819,247 ක් වූ අත්තිකාරම් නිරවුල් කර ගැනිමට 2011 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි

3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) අභ්‍යන්තර පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය